ප්‍රධාන ලේකම් කාර්යාලය - උතුරුමැද පළාත - අනුරාධපුර
பிரதான செயலாளர் அலுவலகம் - வடமத்திய மாகாணம் - அநுராதபுரம்
OFFICE OF THE CHIEF SECRETARY - NORTH CENTRAL PROVINCE - ANURADHAPURA

උතුරු මැද පළාත් සභා සංකීර්ණය, 4 වන මහල B,හරිශ්චන්ද්‍ර මාවත,අනුරාධපුර.
வட மத்திய மாகாண சபை கட்டிடத் தொகுதி, 4ஆம் மாடி, B, ஹரிஸ்சந்ர மாவத்த, அநுராதபுரம்.
North Central Provincial council Complex, 4th Floor B, Harischandra Mawatha, Anuradhapura.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary

දුරකථනය / தொ.பே.இல. / Tele: 025-2222695
Fax: 025-2224914
විමසීම් / விசாரணை / Inquiries: 025-2235790
E-mail csncpc@gmail.com


මගේ අංකය / எனது இல. / My No.:

ඔබේ අංකය / உமது இல. / Your No.: NCP/CS/PT/AP/03/E Banking

දිනය / திகதி / Date: 2019.11. 20

සියළුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු,
අමාත්‍යාංශ ලේකම්වරු,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
ප්‍රාදේශීය ලේකම්වරු,
කළාප අධ්‍යාපන අධ්‍යක්ෂවරු,
ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන් වෙත,

**<u>කාර්යාලීය ජංගම ගිණුම් සඳහා අන්තර්ජාල බැංකුකරණ (E Banking) පහසුකම් ලබා දීම.</u>**

උතුරු මැද පළාත් සභාව යටතේ පවතින ආයතන හා උතුරු මැද පළාත තුල පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා බැංකු ගිණුම් කටයුතු අධීක්ෂණය හා බැංකු ප්‍රකාශන ලබා ගැනීම පහසුකරවීම පිණිස ලංකා බැංකුව හා මහජන බැංකුව වෙතින් අන්තර්ජාල බැංකුකරණ (E Banking) පහසුකම් සලසා දීමේදී මැදිහත්තරුවෙකු ලෙස කටයුතු කිරීමට පළාත් භාණ්ඩාගාරය විසින් තීරණය කර ඇත. මෙම පහසුකම් සක්‍රීය කිරීම මගින් ජංගම ගිණුමේ ගණුදෙනු පරීක්ෂා කිරීම සඳහාත්, අවශ්‍ය ඕනෑම අවස්ථාවකදී බැංකු ප්‍රකාශණයේ පිටපත් ලබා ගැනීමටත් හැකියාව ලැබේ. (අන්තර්ජාල බැංකුකරණය භාරහා ගෙවීම් කළ නොහැක.) මෙමඟින් පළාත් භාණ්ඩාගාරය වෙත හා විගණනය වෙත මාසික බැංකු සැසඳුම් ප්‍රකාශණ ඉදිරිපත් කිරීමට ප්‍රමාද වීම වළක්වාගත හැකිය.

02. ඒ අනුව, ඔබ ආයතනයේ ජංගම ගිණුමට අදාලව ලංකා බැංකුවේ හෝ මහජන බැංකුවේ අන්තර්ජාල බැංකුකරණ අයදුම් පත්‍රය හා ආදර්ශ ආවරණ ලිපිය www.treasury.nc.gov.lk වෙබ් අඩවියට පිවිසීමෙන් ලබා ගත හැකිය. දැනට මෙම අන්තර්ජාල බැංකුකරණ (E Banking) පහසුකම් ලබා ගෙන ඇති ආයතන මේ සඳහා අයදුම් නොකළ යුතු අතර ඒ බව ලිඛිතව දැන්වීම ප්‍රමාණවත් වේ.

03. මෙම අයදුම්පත්‍රය නිසි ලෙස සම්පූර්ණ කර ආවරණ ලිපිය ආයතනයේ ලිපි ශීර්ෂයක මුද්‍රණය කර අයදුම්පත්‍රයේ මුල් පිටපත හා ඡායාපිටපතක් සමඟ අධ්‍යක්ෂ (ගිණුම් හා ගෙවීම්), පළාත් භාණ්ඩාගාරය, උතුරු මැද පළාත යන ලිපිනයට **2019.12.10** දිනට පෙර එවිය යුතුය.

04. මේ සම්බන්ධව ඔබගේ අවධානය යොමු කර ප්‍රමුඛ හා අනිවාර්ය කාර්යයක් සේ සලකා කටයුතු කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

**කේ.පී.එස්.පී.වීරකෝන්**
අධ්‍යක්ෂ (ගිණුම් හා ගෙවීම්)
ප්‍රධාන ලේකම් වෙනුවට,
උතුරු මැද පළාත.